## පළමුවන කියැවීම

1 රාජාවලිය 19:16, 19-21

රාජාවලියේ පළමුවන පොතෙන් ගත් පාඨයෙකි.

**"එලිෂා නැඟිට එලියා පසුපස ගොස් ඔහුට සේවය කෙළේ ය."**

"ආබෙල් මෙහොලාහී ෂාපාත්ගේ පුත් එලිෂා නුඹ වෙනුවට දිවැසිවරයෙකු ලෙස ආලේප කරන්නැ"යි සමිඳාණෝ එලියාට කී සේක. මෙසේ එලියා එතැනින් ගිය විට ෂාපාත්ගේ පුත් එලිෂා ඔහුට සම්බ විය. එලිෂා ගවයන් දොළොස් බානක් පිටුපස හාමින් සිටියේ ය. දොළොස් වන බාන සමඟ එලිෂා සිටිනු ඔහු දිටී ය. එලියා ඔහු ළඟට ගොස් සිය සළුව ඔහු පිට හෙළී ය. එවිට ඔහු ගවයන් අත්හැර එලියා පසුපස දුව ගොස්, "මාගේ පියාණන් හා මෑණියන් සිඹ එන්නට මට අවසර ලැබේ වා! ඉන්පසු ඔබ පසුපස එන්නෙමි"යි කීවේ ය. ඔහු ද කතා කොට, "හැරී යන්න; මම ඔබ නොවළක්වමි"යි ඔහුට කීවේ ය. එවිට එලියා වෙතින් එලිෂා හැරී ගොස් ගවයන් බාන රැගෙන මරා, ගවයන්ගේ වියදඬු දර වශයෙන් පාවිච්චි කර, උන්ගේ මස් තම්බා, මිනිසුන්ට දුන්නේ ය. ඔව්හු ද එය කෑවෝ ය. පසු ව එලිෂා නැඟිට එලියා පසුපස ගොස් ඔහුට සේවය කෙළේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 16:1-2, 7-11

පිළිතුර: සමිඳුනි, අපගේ උරුමය ඔබ වහන්සේ ය.

ගීය: දෙවිඳුනි, මම ඔබ සරණ කොට ගතිමි. එබැවින් මා රැකගත මැනව. මම මෙසේ කීමි: "සමිඳුනි, ඔබ මාගේ ස්වාමීන් වහන්සේ ය.
මාගේ සව් සම්පත ය. ඔබ හැර අන්කිසි සෙතක් මට නැත්තේ ය.

මට උවදෙස් දෙන හිමි තුමන් හට තුති කරන්නෙමි. රෑ යාම්වල දී මා සිත්සතන්හි නුවණ පහළ වන්නේ ය. හිමි තුමන් නිරතුරු මා අබියස තබාගන්නෙමි. මා දකුණු පස එතුමාණන් වැඩ වසන බැවින් මම නොසැලෙන්නෙමි.

එබැවින් ම සිත උදන් අනයි; ම හද ප්‍රීතියෙන් පිනා යන්නේ ය; මා ගත සුරැකි ව ඇත්තේ ය. මන්ද, ඔබ මා පාතාලයෙහි නොරඳවන සේක; ඔබේ දැහැමි තැනැත්තාට ජරාපත් වීමට ඉඩ නොදෙන සේක.

ඔබ මට ජීවන මඟ හෙළි කරන සේක. ඔබ අබිමුවෙහි පිරිපුන් සතුට මට වන්නේ ය. ඔබ දකුණු පස සැප සම්පත් සදහට ම ඇත්තේ ය.

## දෙවන කියැවීම

ගලාති 5:1, 13-18

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**"සහෝදරවරුනි, ඔබ නිදහස්කමට කැඳවනු ලැබුවහු ය."**

ක්‍රිස්තුන් වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමට ය. එබැවින් දාසකම නමැති වියගහකට නැවත යටත් නොවී ස්ථිර ව සිටින්න. සහෝදරවරුනි, ඔබ නිදහස්කමට කැඳවනු ලැබුවහු ය; ඔබගේ ඒ නිදහස මාංසික තෘෂ්ණා සඳහා වැය නොකොට, ප්‍රේමයෙන් එකිනෙකාට සේවය කරන්න. මන්ද, ඔබට මෙන් ඔබේ අසල්-වැසියාට ප්‍රේම කරන්න යන එක ශික්ෂා පදයෙහි මුළු ව්‍යවස්ථාව සම්පිණ්ඩනය වී ඇත. එහෙත් ඔබ එකිනෙකා උනුනුන් කුළල් කාගන්නහු නම්, ඔබ එකිනෙකාගෙන්

විනාශ නොවන හැටියට වග බලාගන්න. ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම ඇති ව හැසිරෙන්න. එවිට ඔබ මාංසික තෘෂ්ණාවලට වසඟ වන්නේ නැත. මන්ද, මාංසික තෘෂ්ණා ආත්මයාණන් වහන්සේට විරුද්ධ ය. ආත්මයාණන් වහන්සේ ද මාංසික තෘෂ්ණාවලට විරුද්ධ ය. දෙපක්ෂය අතර ඇති මේ විරෝධය නිසා, ඔබ කැමැති දේ ඔබට කළ නොහැකි ය. එහෙත් ඔබ ආත්මයාණන් වහන්සේ විසින් මග පෙන්වනු ලබන්නහු නම්, ඔබ ව්‍යවස්ථාව යටතේ නොසිටින්නහු ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

1 සාමුවෙල් 3:10

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණන් වහන්ස, කතා කළ මැනව.
"ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටී"
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 9:51-62

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ වහන්සේ යන ඕනෑ ම තැනකට වුව ද මමත් ඔබ අනුව එන්නෙමි."**

තවද, වහන්සේගේ ස්වර්ගාරෝහණ දිනය ආසන්න වූ කල, උන් වහන්සේ ජෙරුසලම බලා යන අධිෂ්ඨානයෙන් තමන්ට පෙරටුව දූතයන් යැවූ සේක. ඔව්හු ගොස් උන් වහන්සේට අවශ්‍ය දේ පිළියෙළ කරන පිණිස සමාරීයයන්ගේ ගමකට ඇතුළු වූ හ. හුදෙක් ජේසුස් වහන්සේ ජෙරුසලමට ම යන්නට අදහස් කර සිටි බැවින් ඔව්හු උන් වහන්සේ නොපිළිගත්හ. උන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ ජාකොබ් ද ජුවාම් ද ඒ දැක, "ස්වාමීනි, මොවුන් විනාශ කරන පිණිස අහසින් ගිනි වැටෙන්නට අප අණ කරනවාට ඔබ කැමැති සේක් ද"යි ඇසූ හ. උන් වහන්සේ හැරී ඔවුන්ට තරවටු කළ සේක. ඉන්පසු ඔව්හු අන් ගමකට ගියහ. ඔවුන් මග බැස යද්දී එක් මිනිසෙක්, "ඔබ වහන්සේ යන ඕනෑ ම තැනකට වුව ද මමත් ඔබ අනුව එන්නෙමි"යි කී ය. ජේසුස් වහන්සේ කතා කොට, "හිවලුන්ට බෙන ද අහසේ කුරුල්ලන්ට කැදලි ද ඇත; එහෙත් මනුෂ්‍ය-පුත්‍රයාණන්ට හිස තැබීමට වත් තැනක් නැතැ"යි ඔහුට වදාළ සේක. උන් වහන්සේ තව කෙනෙකුට, "මා අනුව එන්නැ"යි වදාළ සේක. ඔහු: "ස්වාමීනි පළමුකොට මාගේ පියා භූමදාන කරන පිණිස යන්නට මට අවසර දුන මැනවැ"යි කී ය. උන් වහන්සේ උත්තර දෙමින්, "මළවුන්ගේ භූමදානය මළවුන් ම කළා වේ; ඔබ ගොස් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන්නැ"යි ඔහුට වදාළ සේක. තවත් කෙනෙක්, "ස්වාමීනි ඔබ අනුව එන්නෙමි; එහෙත් පළමුකොට මාගේ ගෙදර උදවියගෙන් සමු ගෙන ඒමට අවසර දුන මැනවැ"යි කී ය. ජේසුස් වහන්සේ, "නගුලට අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැ"යි ඔහුට වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.